*සැ. යු.*– 2007.03.23 දින පළවූ අංක 1,490 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,491- 2007 මාර්තු 30 වැනි සිකුරාදා - 2007.03.30**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 356 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 354 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 357 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් .. ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

(i) *සැ. යු.*– දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2007 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ජපන් භාෂා අධ්‍යාපනය සඳහා වූ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 පෙබරවාරි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මාර්තු මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 110

## ජාතික ශිෂ්‍යභට බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම

*2006 සැප්තැම්බර් මස 12 වන දින සිට තාවකාලික මේජර් වශයෙන් :–*

කපිතන් ඩබ්ලිව්ජීඑස් ප්‍රේමතිලක

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 වැනි දින,
කොළඹ දී ය.

03-744

---

2007 අංක 111

ඩී/ආර්එෆ්/824/එන්වයි/01/03.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2006 මාර්තු මස 13 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (එස්එස්ඩී) වශයෙන්:–*

ලුතිනන් (එස්එස්ඩී) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (එස්එස්ඩී)] හෙට්ටිආරච්චිගේ නිශාන්ත සංජීව පෙරේරා, එන්ආර්එක්ස් 0858, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 24 වෙනි දින,
කොළඹ දී ය.

03-832

---

2007 අංක 112

ඩී/ආර්එෆ්/824/එන්වයි/01/03.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2006 මාර්තු මස 13 දින සිට ලුතිනන් කොමාන්ඩර් (බීඑච්) වශයෙන්:–*

ලුතිනන් (බීඑච්)[තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (බීඑච්)] ගීගනගේ සුජීව දේවින්ද වීරසූරිය, ශ්‍රීලංනාහ

*2006 මාර්තු මස 13 දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් .–*

ලුතිනන් (සැ) [(තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] හේරත් මුදියන්සේලාගේ සමන්ත ප්‍රීති කුමාර හේරත්, ශ්‍රීලංනාහ

*2006 මාර්තු මස 20 දින සිට කොමාණ්ඩර් (සැ) වශයෙන් .–*

ලුතිනන් (සැ) [(තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] මඩකුඹුරේ මුදියන්සේලාගේ සිරි අනුරුද්ධ කරුණාතිලක, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

03-834

---

2007 අංක 113

ඩී/ආර්එෆ්/824/එන්වයි/01/03.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2006 අප්‍රේල් මස 01 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා) වශයෙන් :–*

ලුතිනන් (මාලිමා) එදිරිසිංහ ආරච්චිගේ ඉන්දික ප්‍රසන්න එදිරිසිංහ, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0960

*2006 අප්‍රේල් මස 04 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා) වශයෙන් .–*

ලුතිනන් (මාලිමා) ජයසිංහ ආරච්චිගේ ප්‍රසාද් චම්පික ජයසිංහ, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0974

2006 අප්‍රේල් මස 09 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා) වශයෙන් .–

ලුතිනන් (මාලිමා) රංජිත් ජයරත්න වල්ගම්පාය, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0971

2006 අප්‍රේල් මස 09 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සීඩීඕ) වශයෙන් .–

ලුතිනන් (සීඩීඕ) කෝණාර මුදියන්සේලාගේ රුවන් තරංග බණ්ඩාර, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0973

2006 අප්‍රේල් මස 16 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (තොතා) වශයෙන් .–

ලුතිනන් (තොතා) චමින්ද විපුලජිත් රණවීර, ශ්‍රීලංනාහ එන්ආර්ටී 0866

2. ඉහත සඳහන් උසස් කිරීම් පරීක්ෂණාත්මක පදනමක් මත වන අතර, උසස් කරන ලද නිලය ඉසිලීමට නුසුදුසු බව පෙනී ගියහොත් නිලධාරීන්ගේ උසස් කිරීම් අවලංගු කොට නැවත පෙර දැරූ නිලයට පත් කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

03 – 833

2007 අංක 114

ඩී/ආර්එෆ්/824/එන්වයි/01/03.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2006 අගෝස්තු මස 02 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන්.–*

ලුතිනන් (වි)රණසිංහ රාජරත්නගේ කමල් කීර්ති සුහසිංහ, එන්ආර්එල් 0934, ශ්‍රීලංනාහ.

2. ඉහත සඳහන් උසස් කිරීම පරීක්ෂණාත්මක පදනමක් මත වන අතර, උසස් කරන ලද නිලය ඉසිලීමට නුදුසුසු බව පෙනී ගියහොත් නිලධාරියාගේ උසස් කිරීම අවලංගු කොට නැවත පෙර දැරූ නිලයට පත් කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

03-831

2007 අංක 115

ඩී/ආර්එfප්/824/එන්වයි/01/03.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :-*

ලුතිනන් (වි) ලන්සක්කාර ජයසුන්දර මුදියන්සේලාගේ බණ්ඩාරතිලක, එන්ආර්එල් 0975. ශ්‍රීලංනාහ

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :-*

ලුතිනන් (වි) ආරුකට්ටු පටබැඳිගේ රාජ් චන්ද්‍රලාල්, එන්ආර්එල් 0976. ශ්‍රීලංනාහ

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (එස්එච්) වශයෙන් :-*

ලුතිනන් (එස්එච්) හෙට්ටිආරච්චිගේ සේනක කුමාරසිංහ, එන්ආර්එච් 0977, ශ්‍රීලංනාහ

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :-*

ලුතිනන් ඉඳුනිල් ප්‍රියන්ත ඉලේපෙරුම, එන්ආර්එල් 0980, ශ්‍රීලංනාහ

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :-*

ලුතිනන් (සැ) මාරසිංහ අච්චිල්ලාගේ කරුණාතිලක. එන්ආර්එස් 0981 ශ්‍රීලංනාහ

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :-*

ලුතිනන් (නාසෙ) වීරවර්ධන පතිරුන්නැහැලාගේ පාලිත සිසිරකුමාර, එන්ආර්පි 0986 ශ්‍රීලංනාහ

*2006 නොවැම්බර් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :-*

ලුතිනන් රංසාධිපතිගේ ඇන්ටනි වීරසිංහ, එන්ආර්එක්ස් 0988, ශ්‍රීලංනාහ

*2006 දෙසැම්බර් මස 01 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :-*

ලුතිනන් (ඉ) කපුරුබංඩාර ආරච්චිගේ ධම්මික සිරිවර්ධන, එන්ආර්ඊ, 0932, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණපරිදි

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 ජනවාරි මස 12 දින,
කොළඹ.

03-835

# ආණ්ඩුවේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥා පනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණය හිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඩබ්ලිව්. ගුණදාස,<br>ලේකම්,<br>ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2007 මාර්තු මස 14 වැනි දින,<br>අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>බත්තරමුල්ල.<br>ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 40490 | ඒකනායක පැලැන්දගේ නුවන් කාමිණී කොස්තා මිය, අංක 133, හොරපෙ, රාගම | බෝගහවත්ත රත්නාකර ආරච්චිගේ ප්‍රියන්ත රත්නායක මයා, කපුවත්ත, පල්ලෙබැද්ද |
| (02) 40491 | ආශා නිල්මිණී කොටිගල මිය, අංක 373/10, නාගහවෙල පාර, කොටිකාවත්ත, මුල්ලේරියාව නව නගරය. | නවගමුවගේ අජිත් ප්‍රේමලාල් මයා, අංක 368, රදන්වත්ත, නාගහවෙල පාර, කොටිකාවත්ත, මුල්ලේරියාව නව නගරය. |
| (03) 40493 | වනසිංහ මුදියන්සේලාගේ ඉන්ද්‍රානි වනසිංහ මිය, පාසල් මාවත, අංක 123, සිල්වත්ගම, ගලේවෙල | වනසිංහ වන්නිනායක මුදියන්සේලාගේ ඇස්වෙදගෙදර සුරේෂ් බුද්ධික වනසිංහ මයා, අංක 134/ඒ, සිල්වත්ගම, ගලේවෙල. |
| (04) 40507 | ජාලජ්ජගේ අනෝමා මල්කාන්ති පීරිස් මිය, අංක 114/35, ඩයස් පෙදෙස, පානදුර | සරුක්කාලි මහාවිදානගේ ඉන්ද්‍රානි සිල්වා මිය, අංක 37, ඩයස් පෙදෙස, වලපල, පානදුර. |

03-798

---

## වන්දනා ආඥාපනත

ගොඩපිටිය මුස්ලිම් උත්සවය - 2007

මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩපිටිය පෝරුවේ (අකුරැස්ස-ගොඩපිටිය) "මොහියදීන් මුස්ලිම් දේවස්ථානයේ" වාර්ෂික ආගමික උත්සවය 2007 අප්‍රේල් 18 දින ආරම්භ වී 2007 අප්‍රේල් 29 වැනි දින අවසන් කරන බව (175 අධිකාරිය) වන්දනා ආඥාපනත යටතේ සකස් කර, 1954 ජනවාරි මස 08 දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද රෙගුලාසිවල 3 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1954 ජනවාරි මස 08 දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද රෙගුලාසි ඉහත පැවැත්වෙන කාලය තුලදී එකී රෙගුලාසිවල සඳහන් එහිම උප ඡේදයෙන් විස්තර වන "කඳවුර තුල" ක්‍රියාත්මක වේ.

බී. රණවීර,<br>ප්‍රාදේශීය ලේකම්,<br>අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2007 මාර්තු මස 09 වැනි දින,<br>අතුරලිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

03-766

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - පානදුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.01.11 දින පවත්වන ලද සී/ස. හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒක ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද සී/ස හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2003.07.01 දින සහ අංක 464 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පේදුරුහේවා ලසිත ද සිල්වා ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිදෙලක්ෂ අනූදෙදහස් දෙසිය හතලිස් දෙකයි ශත හැත්තෑනවය (රු. 2,292,242.79) ක මුදලක් 2005.11.30 වන දිනට සී/ස හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 2,292,242.79 ක මුදලට 2005.12.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරණ ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 464 දරන උකස් බැඳුම්කරය මගින් සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ, වරිපනම් අංක. 66, 66 1/1 හි උයන පාර, උයනේ පිහිටි "මාදන්ගහවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එල්. එන්. ප්‍රනාන්දු විසින් 1997 ක්වූ ජනවාරි මස 21 වන දින මැන සාදන ලද අංක 3210 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩමට උතුරට: පෞද්ගලික පාරෙන්ද, නැගෙනහිරට: කුමාර් ජයවර්ධනට අයිති ඉඩමෙන් ද, දකුණට: හේමන්ත පෙරේරාට අයිති ඉඩමෙන් ද, බටහිරට: උයන පාරෙන් ද මායිම් වූ පර්චස් දොලහ (අ. 0, රූ. 12, පර්.) විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම්. 2224/216 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03-828/2

## මහජන බැංකුව - කෙහෙල්වත්ත

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.03.31 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. රම්‍යමාලා මෙන්ඩිස් මහත්මිය විසින් සහතික කරන ලද අංක 1602 සහ 2003.04.04 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු ගෙවීම් කිරීම මිරිහාන ආරච්චිගේ තිලකා කමලාවතී පෙරේරා විසින් පැහැර ඇති හෙයින් දැන් එකී අංක 1602 දරන බැඳුම්කරය මත රුපියල් හත් ලක්ෂ අනූ හතර දහස් එකසිය දොළහයි ශත අනූ හතරක (රු. 7,94,112.94) මුදලක් මහජන බැංකුවට අය විය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් හත් ලක්ෂ අනූ හතර දහස් එකසිය දොළහයි ශත අනූ හතරක (රු. 7,94,112.94) එකී මුදල ද 2003.06.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හත් ලක්ෂ අනූ හතර දහස් එකසිය දොළහයි ශත අනූ හතරක (රු. 7,94,112.94) මුදලක් මත වර්ෂයකට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද විකිණීමේ ගාස්තු ද, එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 1602 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උසක් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ටී ඇන්ඩ් එච් වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කැළණිය උප නගර සභා සීමාව තුළ ගෝනවල ගමේ පිහිටියා වූ ද ගෝනගහවත්ත යයි කියනු ලබන හා හඳුන්වනු ලබන දැන් "ලෙස්මලේන්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. පී. ද සිල්වා විසින් සාදන ලද අංක 161 හා 1985.11.20 දින දරන පිඹුරේ ලොට් අංක 22 ලෙස ලකුණුකොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : මෙහි ලොට් අංක 21 ද, නැගෙනහිරට : මෙහි ලොට් අංක 15 හා 16 ද, දකුණට : කුඩා පාර ද, බස්නාහිරට : මෙහි ලොට් අංක 46 ද, මායිම්වන්නා වූ ද පර්චස් පහළොවයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්.15.4) විශාල වූ ද, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C466/69 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි හා එකී දේපළට ස්ථිර ලෙස සවිකර ඇති උපකරණ සහ යන්ත්‍රෝපකරණ හා එහි පිහිටි සියළු දේත් ය.

තව ද එකී අංක 161 දරන පිඹුරේ ලොට් අංක 46, 44, 45 හා 48 දරන (පාර සඳහා වෙන් කිරීම වන) ඉඩම් කොටස් උඩින් හා දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට අතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කළාප 01.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (බටහිර කළාප 01)
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

03-825

## මහජන බැංකුව - යක්කල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.01.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 1999.08.17 දිනැති අංක 4193 සහ 2004.01.30 දිනැති අංක 8910 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, කහවිට අප්පුහාමිලාගේ දෝන අචින්තා කහවිට සහ කහවිට අප්පුහාමිලාගේ දොන් ජයන්ත කහවිට *නොහොත්* කහවිට අප්පුහාමිලාගේ දොන් ජයන්ත යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ හතළිස් එක්දහස් හයසිය පහළොව (රු. 2,41,615.00) සහ රුපියල් දෙලක්ෂය (රු. 200,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.02.11 දින සිට වර්ෂයකට 26.5% බැගින් රුපියල් දෙලක්ෂ හතළිස් එක්දහස් හයසිය පහළොව (රු. 2,41,615) සහ 2006.03.01 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් දෙලක්ෂය (රු. 2,00,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ හතළිස් එක්දහස් හයසිය පහළොව (රු. 2,41,615) සහ රුපියල් දෙලක්ෂය (රු. 2,00,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 4193 සහ 8910 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ, අලුත්ගම බෝගමුව දැනට යක්කල ගමෙහි පිහිටි ලුයිසා එස්ටේට් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් 1993.03.13 වන දින මැන සකස් කල අංක 1143 දරන පිඹුරේ ලොට් අංක 8 දරන කොටසට මායිම් උතුර-නැගෙනහිරට : ලොට් 34ද, දකුණු-නැගෙනහිරට : ලොට් 32 ද, දකුණු-බස්නාහිරට : ලොට් 9 හා 10 ද, උතුරු-බස්නාහිරට : ලොට් 7 ද යන මායිම් තුල පිහිටි පර්චස් විසිහතයි දශම දෙක (අ. 0, රු. 0, පර්. 27.2) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 696/190 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී ඉඩමට යාම ඒම සඳහා බලය ලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1972.08.03 දින මැන සාදන ලද අංක 1213 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 32, 33, 34 සහ 35 හි මාර්ග අයිතිය ද සමග වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙලින් අංක ඊ. 669/ 208, ඊ. 731/177, ඊ. 520/276 සහ ඊ. 568/253 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර, බැළුම්මහර,
මුදුන්ගොඩ.

03-826

## මහජන බැංකුව - යක්කල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.10.26 දිනැති අංක 10526 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මලුගේ ප්‍රියන්ත ඩයස් යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ විසි තුන්දහස් දෙසිය තිස් දෙකයි ශත හතළිස් හතර (රු. 423,232.44) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2005.12.03 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් හාරලක්ෂ විසි තුන්දහස් දෙසිය තිස් දෙකයි ශත හතළිස් හතර (රු. 4,23,232.44) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ විසි තුන්දහස් දෙසිය තිස් දෙකයි ශත හතළිස් හතර (රු. 4,23,232.44) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසි කාර ශොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 10526 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභාවේ යක්කල ප්‍රාදේශීය සභා උපකාර්යාල සීමාවේ බඳුවතුගොඩ පිහිටි දුනුමඩලගහවත්ත, නැමැති ඉඩමට බලය ලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් 1996.11.30 වන දින මැන සකස් කළ අංක 63 දරන පිඹුරේ ලොට් අංක 01 දරන කොටසට මායිම්- උතුරට : පිඹුරු අංක 36 ඒ/55 හි ලොට් 3 සී ඉතිරි කොටස ද, නැගෙනහිරට : කේ. පී. එඩ්වින්ට අයත් ඉඩම හා කේ. පී. දියානිස්ගේ උරුමකරුවන්ට අයත් ඉඩම් ද, දකුණට : පාර සහ එච්. පී. මේරි ට අයත් ඉඩම ද, බස්නාහිරට : පිඹුරු අංක 36ඒ/55 ලොට් 3 බී දරන ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුල පිහිටි පර්චස් විසි දෙකයි දශම එකයි දෙක (අ. 0, රු. 0, පර්. 22.12) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 514/200 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර, බැළුම්මහර,
මුදුන්ගොඩ.

03-824

## මහජන බැංකුව - ලකි ප්ලාසා ශාඛාව (331)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006.08.18 දින පැවති එහි රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මිය විසින් සහතික කරන ලද අංක 1097 හා 2003.07.28 දින දරන උකස් බැඳුම්කරය මත ගෙවීම් නිහාල් සමරසූරිය විසින් පැහැර හැර ඇති බැවින් අංක 1097 දරන එකී බැඳුම්කරය ප්‍රකාර රුපියල් එක්කෝටි තිස් ලක්ෂ දහ අටදහස් දෙසිය නවයයි ශත එකොලහක් (රු.13,018,209.11) වන මුදලක් මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එකී රුපියල් එක්කෝටි තිස් ලක්ෂ දහඅට දහස් දෙසිය නවයයි ශත එකොලහක් වන මුදල (රු.13,081,209.11) 2005.05.04 දින සිට විකිණීමේ දිනය තෙක් එකී රුපියල් එක්කෝටි තිස් ලක්ෂ දහ අටදහස් දෙසිය නවයයි ශත එකොලහක් (රු.13,018,209.11) වන මුදල මත වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් තවදුරටත් පොලිය ද, විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තු ද එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා එකී අංක 1097 දරන බැඳුම්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, කිරුළ 41, ඡන්ද කොට්ඨාශයේ, නාරාහේන්පිට පිහිටි, චිත්‍රා පටුමගේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. එන්. පී. විජේවීර විසින් සාදන ලද අංක 282 හා 1981.11.11 දින දරන සැලැස්මේ කහටගහවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩමේ ලොට් අංක 2 වශයෙන් ලකුණු කර නිරූපණය කර ඇති, උතුරට : ලොට් අංක 01 හා චිත්‍රා පටුමඟ වරිපනම් අංක 56, නැගෙනහිරට : ෆයිප් පාර වරිපනම් අංක 49/19,49/18,හා 49/16 හා දකුණට : චිත්‍රා පටුමග වරිපනම් අංක 18/10, 18/9 හා 46 හා බස්නාහිරට : ලොට් අංක D1 හා චිත්‍රා පටුමගද මායිම් වන්නා වූ පර්චස් විසි අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 28.25) විශාල වූ බෙදා වෙන් කරන ලද මුලු ඉඩම් කොටස සහ එහි පිහිටි වෙනත් සියළු දේත් ය.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ V/FA 984/212 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කලාපය-01).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය - 01)
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

03-823

## සී/ස හැටන් නැෂනල් බැංකුව- කුලියාපිටිය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.01.25 දින පවත්වන ලද සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ අධයක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරන විසින් සී/ස හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 2005.08.24 දින සහ අංක 1132 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කරුණා පේඩ්ලාගේ සුගන්ධි ප්‍රියදර්ශණී ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් දොලොස්ලක්ෂ තිස්පන්දහස් හාරසිය අසූදෙකයි ශත විසිහතක (රු. 1,235,482.24) ක මුදලක් 2006.10.31 වන දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,235,482.24 ක මුදලට 2006.11.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1132 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාශයේ, කටුගම්පොල, හත්පත්තුව තුල යගම්පත්තු කෝරළේ, ඉහල මන්දකෝන්දන, ගමේ වෙරළුගස්ආගර පිහිටි "කෙවුල්කැළේ" නමින් හඳුන්වනු ලබන ඉඩමට උතුරට : වෙරළුගස්ආගරවැවෙන්ද, නැගෙනහිරට : ඇලෙක්සැන්ඩර් පෙරේරාට අයිති ඉඩම ද, දකුණට : ප්‍රධාන පාරෙන් ද, බටහිරට : කේ. ඒ ද නවාමිට අයිති ඉඩමෙන් ද, මායිම් වූ රූඩ් දෙකක් (අ. 0, රූ. 02, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් පස, ගස් වැවිලි සහ ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ආර්" කොට්ඨාශයේ 35 වන වෙළුමේ 264 පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක එස්. එම්. දිසානායක විසින් 2005ක් වූ අප්‍රේල් මස 29 වන දින මැන සාදන ලද අංක 1393 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩමට උතුරට : වෙරළුගස්ආගර වැවෙන් ද, නැගෙනහිරට : ඇලෙක්සැන්ඩර් පෙරේරාට අයිති ඉඩම ද, දකුණට : දුම්මලසූරියේ සිට පදිවෙල දක්වා දිවෙන අධිවේගී මාර්ගයෙන් ද, බටහිරට : කේ. ඒ. නවාමිට අයිති ඉඩමෙන් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් විසිඅටක් (අ. 0, රූ. 01, පර්. 28) විශාලත්වය ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති)
මණ්ඩලයේ ලේකම්.

03-828/1

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 18/60793/වයි18/281.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.05.22 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ටී. ටී. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 1997.04.18 දින හා අංක 5820 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, බිංගිරිය පදිංචි හොරතල් ජේඩිගේ ජයසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.04.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැත්තෑනව දහස් තිස්එකයි ශත හැත්තෑපහ (රු. 79,031.75) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5820 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසිහයයි ශත දාසය (රු. 26.16) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ජේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පනාවැව පිහිටි කෝන්ගහමුලහේන නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ගුණසේකර විසින් සකසන ලද 1995.07.17 සහ 21 දිනැති අංක 310/95 දරන පිඹුරේ කැබලි අංක 14 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 18.5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද, එකී 310/95 දරන පිඹුරේ පාර සඳහා වෙන් කරන ලද කැබලි අංක 4 මගින් දක්වා ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 මාර්තු මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

03-841/1

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006 දෙසැම්බර් මස 21 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතික යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 10, ශ්‍රී සද්ධර්ම මාවත, අංක 235 දරන ස්ථානයේ මොහමඩ් රෝෂන් යාසීන් යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 ඔක්තෝබර් මස 11 දාතම හා අංක 1109 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2006 ඔක්තෝබර් මස 16 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහතුන් ලක්ෂ හාරදහස් දෙසීය අසූදෙකක් (රු. 1,304,282) එකී ණය පහසුකම් මත හිඟව ඇති මුල් මුදල වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහතුන් ලක්ෂ හාර දහස් දෙසීය අසූ දෙකක (රු. 1,304,282) සම්පූර්ණ හිඟ මුදල සමඟ තවත් රුපියල් එකොළොස් ලක්ෂ අනූහත් දහස් දෙසීය දහසයකුත් ශත පනස් හයක (රු. 1,197,216.56) මුදල සඳහා වසරකට සියයට දහතුන (13%) බැගින් 2006 ඔක්තෝබර් මස 17 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ එතෙක් ගෙවී ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1109 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව නගර සභා සීමාව ඇතුළත සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව, ඉඩම ග්‍රාමයේ පිහිටි එච්ලින් ද සොයිසා ආර්යා මාවතේ, වරිපනම් අංක 69 දරන කෙමින්ගාරු තොටුපලබොඩ බක්මීගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද 1997 ජූනි මස 20 දාතම හා අංක 1403 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට : එල්. ජේ. මෙතෙස් ද සිල්වා ගේ දේපළ ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ඩබ්ලිව්. ජෝන් විල්සන් මෙන්ඩිස් ට අයත් මෙම ඉඩමේම කොටසක් ද, දකුණට : අංක 54 පිඹුරේ ලොට් ඒ ද, බටහිරට : එච්ලින් ද, සොයිසා ආර්යා මාවත සහ අංක 1402 පිඹුරේ ලොට් 1 ද මායිම් වන ඉහත කී අංක 1403 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 15.12) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමග සහ එයට අදාල සියළු අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව සමග ය.

අංක 1403 පිඹුරේ ඉහත කී ලොට් 2 පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිනුමකි.

ඉහත කී මොරටුව, ඉඩම ග්‍රාමයේ පිහිටි එච්ලින්ද සොයිසා ආර්යා මාවත වරිපනම් අංක 38 දරන කෙමින්ගාරු තොටුපලබොඩ බක්මීගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. එම්. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද

1942 ජුනි මස 11 දාතම හා අංක 54 දරන පිඹුරේ ලොට් බී වශයෙන් ලකුණු කොට නිරූපිත ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ වෙළුම/පත් ඉරුව M2287/159 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 54 පිඹුරට අනුව, උතුරට : ලිදමුලගේ ජෝන් මෙතෙස් ද සිල්වාට අයත් ඉඩම ද, නැගෙනහිරට : වර්ණකුලසූරිය වඩුමෙස්ත්‍රිගේ ජෝන් මෙන්දිස්ට අයත් ඉඩම ද, දකුණට : ලොට් ඒ වශයෙන් ලකුණු කොට ඇති මෙම ඉඩමේම කොටසක් ද, සහ බටහිරට : ලිදමුලගේ ජේම්ස් සිල්වාට අයත් ඉඩම සහ එව්ලින් ද සොයිසා ආර්යා මාවත ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 17.12) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-843/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.